# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,594 — 1965 දෙසැම්බර් 24 වැනි සිකුරාද — 1965.12.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදු ඇත.)

## මිල පාලන දැන්වීම්

අංක: ඇන්.ඊ. 99 දරණ මිළ ආඥාව

### පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම්

### මිළ පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3(2) වන වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නුවරඑළිය දිස්ත්‍රික්කයේ (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක තැන්පත් ඉලෙකුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම මේ ආඥාවෙන් :—

(1) මේ ආඥාව පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්වේ.

(2) මේ ආඥාව නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයට අදල විය යුතුය.

(3) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ නියමකොට ඇති මිල ගණන්, ඒ උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට දක්වා ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් පාරිභෝගිකයින්ට විකිණිය යුතු උපරිම මිල ගණන් වන අතර, ඒ මිළ ගණන්වලට වඩා ඉහළ මිල ගණන්වලට නොවිකිණිය යුතුය.

(4) (i) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් වර්ගවලින් යම් ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා වෙළෙන්දෙකුට විකිණීම හෝ ඒ උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් වර්ගවලින් වරකට දුසිම් භාගයකට නොඅඩු ප්‍රමාණයක් විකිණීම තොග වෙළඳාමක් වශයෙන් සැලකිය යුතුය.

(ii) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් වර්ගවලින් පරිභෝගය හෝ ප්‍රයෝජනය සඳහා දුසිම් භාගයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් වශයෙන් සැලකිය යුතු ය.

(iii) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් වර්ගවලින් නැවත විකිණීම සඳහා විකිණීම හෝ ප්‍රයෝජනය සඳහා හෝ තොග වශයෙන් විකිණීම නො කළ යුතු ය.

(5) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් කිසිවක් විකිණීම සඳහා යම් ස්ථානයක හෝ වාහනයක හෝ තමා සතුව හෝ තම පාලනය යටතේ ඇති සෑම වෙළෙන්දකුම, ඒ පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් වර්ගය ද, උසින් අඟලකට නොඅඩු ඉලක්කම් වලින් මේ ආඥාවෙන් පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් සඳහා නියමකර ඇති උපරිම මිල ද, යම් ගණුදෙනු කාරයකුට පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

(6) පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් කිසිවක් විකුණන සෑම තැනැත්තකු විසින්ම—

(අ) විකිණීම සිදු කළ දිනය ;

(ආ) විකුණූ පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් පිළිබඳ විස්තර සහ විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා අය කළ මුදල.

දක්වා තිබියයුතු කුවිතාන්සියක් ගැණුම්කරුට දිය යුතු ය.

(7) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට දක්වා ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් වෙළෙන්දකු වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑම තැනැත්තකු විසින්ම මා වෙත 1965 දෙසැම්බර් මස 31 වැනි දින මධ්‍යාහ්න 12 නොඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතු ය :—

(අ) ඒ වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ තමා සතුව හෝ තම පාලනය යටතේ හෝ ඇති පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් ප්‍රමාණය සහ ;

(ආ) ඒ තොග තබා ඇති එක්, එක් ගබඩාව හෝ සෙසු ස්ථාන.

(8) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ නියමකර දක්වා ඇති උපරිම මිලට, ඒ පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් විකුණනු ලබන අවස්ථාවේදී ඒවා යම් දෙයකින් ඔතා තිබෙනම් හෝ බඳුනක බහා තිබෙනම් හෝ ඒ ඔතනයේ හෝ බඳුනේ මිල ඇතුළත් විය යුතු ය.

(9) මේ මිල ආඥාව උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයට අදල නොවේ.

(10) පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් යනුවෙන් සලකනු ලබන්නේ උපලේඛනයේ 1 වැනි තීරයේ විස්තරකොට දක්වා ඇති ඇඳුම් වර්ගයන් ය.


අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ (විවිධ ද්‍රව්‍ය)
නියෝජ්‍ය මිල පාලක තැන,


1965 දෙසැම්බර් මස 21 වැනි දින,
ප.ව. 4ට නුවරඑළිය කච්චේරියේදී, අත්සන් කරනලදි.

### උපලේඛනය

| | 1 තීරය | 2 තීරය | |
|---|---|---|---|
| | පාවිච්චි කරනලද උණුසුම් ලෝම ඇඳුම් | එක් භාණ්ඩයක් සඳහා උපරිම සිල්ලර මිළ | |
| | | රු. | ශ. |
| 1. | මහතුන්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම කබා ... | 12 | 0 |
| 2. | නෝනා මහතුන්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම කබා ... ... ... | 10 | 0 |
| 3. | මහතුන්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම කලිසම් | 8 | 0 |
| 4. | මහතුන්ගේ සහ නෝනා මහතුන්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම පිට කබා ... ... | 15 | 0 |
| 5. | ළමයින්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම පිට කබා | 5 | 0 |
| 6. | මහතුන්ගේ සහ නෝනා මහතුන්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම අත්දිග ස්වෙටර්ස් ... | 6 | 0 |
| 7. | මහතුන්ගේ සහ නෝනා මහතුන්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම අත්කොට ස්වෙටර්ස් ... | 5 | 0 |
| 8. | ලමයින්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම අත්දිග ස්වෙටර්ස් ... ... ... | 3 | 0 |
| 9. | ළමයින්ගේ පාවිච්චි කරනලද උණුසුම් ලෝම අත්කොට අත්කොට ස්වෙටර්ස් ... ... | 2 | 0 |
| 10. | පාවිච්චිකරනලද උණුසුම් ලෝමපොරෝන (බ්ලැන්කට්) ලොකු (60" × 80" ප්‍රමාණයේ හෝ ඉන් වැඩි ප්‍රමාණයේ ඒවා ලොකු ඒවා වශයෙන් සලකනු ලැබේ) | 20 | 0 |
| 11. | පාවිච්චිකරනලද උණුසුම් ලෝමපොරෝන (බ්ලැන්කට්) කුඩා (60" × 80" ප්‍රමාණයෙන් අඩු ඒවා කුඩා වශයෙන් සලකනු ලැබේ) ... ... | 10 | 0 |

12–1362


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.

1821——ආර් 11132—7,250 (65/12)